**ඇල්පිටිය ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

-----------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 09 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 11 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ නිම කරන ලද පාලම් 06 ක් ඉදිකිරීම වෙනුවෙන් රු.1,611,500 ක් ගෙවීම් කර තිබුණ ද, මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ලෙස ණයහිමියන් යටතේ දක්වා තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල ණයහිමියන් වැඩියෙන් දැක්විණි.

(ආ) ග්‍රාමීය පාලම් 08 ක් ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුල රු.2,511,500 ක මුදලක් ලැබී තිබුණ ද, ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමෙන් රු.2,511,500 කින් ණයගැතියන් වැඩියෙන් පෙන්නුම් කෙරිණි.

(ඇ) රු.170,378 ක් වූ විදුලි භාණ්ඩ තොගය මූල්‍ය ප්‍රකාශනවල විදුලි ගබඩා ලෙස සටහන් නොකර පොදු ගබඩා ශේෂයට එකතු කර දැක්විණි.

(ඈ) වෙනත් ආධාර ලැබීම් සමාලෝචිත වර්ෂය තුළ රු.64,972 ක් ලෙස ලෙජරයේ දක්වා තිබුණ ද, ආදායම් හා වියදම් ගිණුමෙහි රු.632,720 ක් ලෙස දැක්විණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 04 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන් හා උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.797,285 ක වෙනසක් පැවතුණි.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.78,884,880 ක් වූ ගනුදෙනු සම්බන්ධව හිමිකම් ඔප්පු, යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, සමීක්ෂණ මණ්ඩල වාර්තා, කාල විශ්ලේෂණය සහ තුලනය කරන ලද තැන්පත් ලේඛනය පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,257,216 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,006,487 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂවල සභාවට අයකර ගතයුතුව තිබූ රු.7,302,719 ක වරිපනම් බදු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) ප්‍රකාරව අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

### 2.2.2 අක්කර බදු

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂවල සභාවට අයකර ගතයුතු රු.346,569 ක් වූ අක්කර බදු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

### 2.2.3 බදු කුලී

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂවල සභාවට අයකර ගතයුතු රු.407,846 ක් වූ බදු කුලී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු.743,917 ක උසාවි දඩ හා රු. 2,816,545 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

### 2.2.5 ජේ.සී.බී. යන්ත්‍රය සඳහා කුලී

සභාව සතු ජේ.සී.බී. යන්ත්‍රය සභිකයින් සහ සභා බලප්‍රදේශයේ පුද්ගලයින් විසින් කුලියට ලබා ගැනීම වෙනුවෙන් රු.86,720 ක් වූ කුලී සභාවට අයවීමට තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

3.1 බලය නොළත් ගනුදෙනු

--------------------------

විදේශ අධ්‍යයන චාරිකා

--------------------------

ප්‍රාදේශීය සභා අරමුදල යෙදවීම පිළිබඳ නීතිමය ප්‍රතිපාදන සලසා ඇති 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තියේ දැක්වෙන කාර්යයන් යටතට නොගැනෙන කාර්යයක් වූ විදේශ අධ්‍යයන චාරිකා 04 ක් සඳහා සභා අරමුදලින් රු.777,500 ක් වැයකර තිබුණි. එමෙන්ම විදේශගතවීමට විධිමත් අනුමැතියක් ද ලබාගෙන නොතිබුණි.

**3.2** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

**------------------------------------**

**වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා නොදීම**

-------------------------------------------

1988 අංක 74 දරන (සංශෝධිත) පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ අවශ්‍යතාවයන් අනුව 2013 වර්ෂය සඳහා සභාපති, උප සභාපති හා සභිකයින් 04 දෙනෙකු විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබූ අතර, 2014 වර්ෂය සඳහා සභාපති, උප සභාපති හා සභිකයින් සියලුදෙනා විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබූ බව 2015 මාර්තු 04 දින සිදු කළ විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

**3.3** **නිෂ්ක්‍රිය වත්කම්**

**------------------**

2013 ජුනි 05 දිනැති අංක : PCMD/PR/2013 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය පරිදි රජයේ ආයතන තුළ ප්‍රයෝජනයට නොගෙන විනාශ වෙමින් පවතින පැරණි වාහන හා යන්ත්‍රෝපකරණ ඉදිරි මාස 03 ක කාලයක් තුළ අපහරණය කිරීමට වැඩපිළිවෙලක් සකස් කරන ලෙසට දන්වා තිබුණ ද, මිලදී ගැනීම් වටිනාකම / පවරාදීම් වටිනාකම රු.645,000 ක් වූ ට්‍රැක්ටර් 02 ක් ද, රු.18,000 ක් වූ ජල බවුසරයක් හා වටිනාකම තක්සේරු නොකළ වාහන 02 ක් සහා භූමියේ දිරාපත් වෙමින් පවතින බව 2015 මාර්තු 04 දින සිදුකරන ලද විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

**3.4** **හඳුනාගත් අලාභ**

**------------------**

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය විසින් 2014 නොවැම්බර් 24 දින 1" ගැල්වනයිස් බට 576 ක් සභාව වෙත ලබා දී තිබුණි. මෙම බටවලින් බට 232 ක් බෙන්තොට ප්‍රාදේශීය සභාවට ලබා දී තිබූ අතර විගණන දිනට පසුව බට 190 ක් ආපසු ලැබී තිබුණි. එමෙන්ම 2015 අප්‍රේල් 01 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේ දී බට 225 ක් සභාවේ තිබූ බව නිරීක්ෂණය විය. මේ අනුව බට 161 ක ඌනතාවයක් පැවතුණු අතර බට ඌනතාවයේ වටිනාකම රු.178,227 ක් විය.

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

-------------------------------------------

**අයවැය පාලන**

-------------------

අයවැය ලේඛනයෙහි ඇස්තමේන්තුගත සහ තථ්‍ය වශයෙන් ලැබූ ආදායම් අතර විචලනයන් පවතින බවත්, ඇතැම් වියදම් විෂයයන්වල ඉතිරි කිරීම් තිබූ බවත් නිරීක්ෂණය විය. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන ඇති බවක් නිරීක්ෂණය නොවුණි.

**5. පද්ධති හා පාලනය**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය